# ලංකාණ්ඩුවේ "ගැසට්" පත්‍රය.

ආණ්ඩුවේ අවසරයපිට ප්‍රසිද්ධකරණලදී.

**නො. 9,651—1947ක්වූ ජනවාරි මස 17 වෙනි දිනවූ සිකුරාදා.**


## Part IV.—හතරවෙනි කාණ්ඩය.

### ආණ්ඩුවට ඉඩම් ලබාගැනීම සම්බන්ධ දැන්වීම.

ආණ්ඩුවේ කටයුත්තකට, ඒනම්:—මාසාර් සිට මල්විල් දක්වා ගමනාගමනමාර්ගයක් පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "203 පරිච්ඡේදයේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" පස්වෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට පලාත් පාලක කාරක සභාවේ නියෝගය පරිදි උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණ ලැබී තිබේ, ඒ ඉඩම්නම්:—

සිතියමේ නො. පී. පී. ඒ 1,449. ගම—සොරන්පත්තු.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරයින්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | තිතුමාත්තෝලම් .. | වයස අවුරුදු 12 සිට 20 දක්වා වයසැති පොල්ගස් 17කින් යුත් පොල් ඉඩමක්ද, වයස අවුරුදු 20 සිට 30 දක්වා වයසැති තල්ගස් 2කින් හා තල්පැල 10ක් සහිත ඉඩම | දෙස්කර ඇස්. ඩබ්ලිව්. සී. රත්නෙගාර් මහතා, 59, මරක්කලවිපිය, වැල්ලවත්ත | 1 0 6 |
| 2 | පුවරෙසිකෝට්ටම් .. | තල්ගස් 2ක් හා කොහොඹගසක් සහිත ඉඩම .. | සින්නම්මා මුරුගේසී. සින්නතම්බිගේ භාර්යාව, පරන්දන් | 0 0 9·4 |

එබැවින් ඉඩම් අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාව දැනගැන්ම සඳහා හයවෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙසින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ හැමදෙනාම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1947ක්වූ පෙබරවාරි මස 26වෙනි දින පූ. භා. 9ට යාපනේ කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙසින් දැනගත යුතුයි. ඉඩමට අයිතිවාසිකම් කියන්ට තිබෙන සියළුම ඔප්පු තිරප්පු පෙන්නා සිටිය යුතු බව සහ ඉඩම් හිමියන් වෙනුවෙන් පෙනීසිටින අය ඉඩම් හිමියන්ගෙන් බලයක් රැගෙන ආ යුතුයි.

වර්ෂ 1947ක්වූ ජනවාරි මස 15වෙනි දින
යාපනේ කච්චේරියේදීය.

සී. කුමාරසාමි,
උතුරු පලාතේ ආණ්ඩුවේ ඒජන්ත වරයා.

---

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3වෙනි ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ කටයුත්තකට, ඒනම්:—ගස්නාවේ අමුන බැඳීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැනීම සඳහා ක්‍රියාකරණ "ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ '203වෙනි පරිච්ඡේදයේ" පස්වෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට පලාත් පාලක කාරක සභාවෙන් නිසිආකාර මට අණ ලැබී තිබේ, ඒ ඉඩමනම්:—

සිතියමේ නො. A 519. ගම—ගස්නාව.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරයින්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | ඇල්ලෙවලවත්ත .. | අවුරුදු 4ක් වයස ඇති පොල්ගස් 1යි, අවුරුදු 10ක් වයස ඇති මීගස් 1යි, සිමෙන්තියෙන් බඳිනලද කාප්පේ සහ ඇල | (1) ගස්නාවේ පදිංචි මොහොතලාගේ උක්කුබන්ඩා, (2) එම හිංගිරි අප්පුහාමි, (3) එම පුංචිමිරල ගග පුංචිබණ්ඩා | 0 0 2·95 |

එබැවින් ඉඩම අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාව දැනගැන්ම සඳහා හයවෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙසින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ හැමදෙනාම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1947ක්වූ පෙබරවාරි මස 17වෙනි දින උදේ 11ට කෑගල්ලේ කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඒට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙසින් දැනගත යුතුයි.

වර්ෂ 1947ක්වූ ජනවාරි මස 7වෙනි දින
කෑගල්ලේ කච්චේරියේදීය.

කේ. කනගසුන්දරම්,
ආණ්ඩුවේ උප ඒජන්ත වරයා.

---

### ඉඩම් සශ්‍රීකකිරීමේ දැන්වීම.

ගම් විශාලකිරීම සඳහා වෙන්කරනලද ඉඩම්වලට අවසරපත්‍ර ලැබීමට සුදුස්සන් තේරීම සඳහා ඉඩම් කච්චේරියේ දැන්වීමයි.

ගම් විශාලකිරීම සඳහා වෙන්කරනලද මෙහි පහත විස්තර දක්වෙන ඉඩම් සඳහාවූ ඉල්ලුම්පත්‍ර කල්පනාවට ගැනීම පිණිසත් කොටස් වශයෙන් ඒ ඉඩම්වලට අවසරපත්‍ර ලැබීමට සුදුස්සන් තෝරාගනු පිණිසත් මැදගම ගමන් බංගලාවේදී වර්ෂ 1947ක්වූ පෙබරවාරි මස 24වෙනි දින ප. භා. 2ට 1935 වෙනි අංක 19 දරන ඉඩම් සශ්‍රීකකිරීමේ ආඥාපණත යටතේ ඉඩම් කච්චේරියක් ඌව දිසාවේ ආණ්ඩුවේ උප ඒජන්තතුමා විසින් පවත්වන බැව් මෙසින් දැනුම්දෙනු ලැබේ.

ඉඩම් කට්ටි ලබාගනු කැමති සෑම අයකු විසින්ම ඉඩම් කච්චේරියට පැමිණිය යුතුයි. නැතහොත් තමා වෙනුවෙන් පෙනීසිටීමට නියෝජිතයකු එවිය යුතුයි.

මේ ඉඩම් කච්චේරිය පිළිබඳව දැනගතයුතු යමක් ඇතහොත් එය ආණ්ඩුවේ උප ඒජන්තතුමාගෙන් විචාරාගත යුතුයි.

ආර්. මැකින්සෙසි ඉංබෙසිකඩර්,
ඌව දිසාවේ ආණ්ඩුවේ උප ඒජන්තතුමා.

වර්ෂ 1947 ක්වූ ජනවාරි මස 6වෙනි දින
බදුලු කච්චේරියේදීය.

### දීමට යන ඉඩම්වල විස්තර

සිතියමේ නො. F. V. P. 169. ගම—හැන්දවින්න.

| කැබෙල්ල. | දියහැකි ප්‍රමාණය (කිට්ටු වශයෙන්). අ. රූ. ප. | මේ ඉඩම්වල වැවීමට සුදුසු ශාක වගී. |
|---|---|---|
| 4 | .. 5 1 28 .. | සුදුසු වැවිලි සහ ගෙවල් සහ පදිංචිවීමට |
| 4B | .. 4 0 3 .. | එම |
| 22K | .. 12 3 32 .. | එම |
| 22L | .. 12 3 20 .. | එම |
| 29 | .. 0 1 14 .. | එම |
| 31 | .. 0 0 11 .. | එම |
| 32A | .. 4 0 0 .. | එම |
| 36 | .. 9 0 20 .. | එම |
| 40 | .. 225 0 0 .. | එම |
| 40X | .. 0 1 4 .. | එම |
| 40AZ | .. 1 0 24 .. | එම |
| 40BS | .. 1 0 0 .. | එම |
| 40BU | .. 1 0 2 .. | එම |

